# 10

# හින්දු උත්සවයක්

**ජාතික ආගමික හා සංස්කෘතික හර පද්ධතීන් පිළිබඳ ජනතාවගේ අවබෝධය, ජනවර්ග අතර අන්‍යොන්‍ය විශ්වාසය, සමගිය හා සාමකාමී සහජීවනය උදෙසා ඉවහල් වේ.**

**දෙමළ ජනයාගේ ඇදහිලි විශ්වාස හා සිරිත් විරිත් ගැන ඔබගේ අවබෝධය පුළුල් වීමට තෛපොංගල් උත්සවය පිළිබඳ මේ පාඩම ඉවහල් වනු ඇත.**

"උපන්නොත් තෛ මාසයේ හොඳ කලක් උදාවේ"

"තෛ මාසයේ කෙනකුගේ ඉපදීම සිදුවේ නම් එය වාසනාවකි. ඔහුගේ අනාගතය යහපත් වන්නේය" යන්න හින්දූන්ගේ පිළිගැනීමයි. හින්දු භක්තිකයන්ගේ අවුරුද්දේ පළමු මාසය තෛ මාසයයි. එය ඉංග්‍රීසි ක්‍රමයට ජනවාරි මාසයයි. සූර්යයා ධනු රාශියේ සිට මකර රාශියට ගමන් කිරීම ආරම්භ කරන අවස්ථාව තෛ මාසයේ උදාව ලෙස පිළිගැනෙයි. එම මොහොත උදාවන්නේ ජනවාරි 14 හෝ 15 හෝ යන දින දෙකින් එකක ය. එම දිනය තෛපොංගල් දිනය ලෙස සැලකේ. හින්දූහු වසර පුරා උත්සව රැසක් පවත්වති. මෙය ඔවුන් වර්ෂය ආරම්භයේ දී පවත්වන අත්‍යුත්කර්ෂවත් උත්සවයකි.



වර්ෂාපතනය, හා ඍතු විපර්යාසය, ගොවිතැනේ සාරවත් බවට බෙහෙවින් බලපායි. සාර්ථක අස්වැන්නක් සඳහා සූර්යයාගේ බලපෑම කිසි විටකත් අමතක කළ නො හැකි ය. තම කෘෂි කටයුතු සඳහා මහෝපකාරී වූ සූර්යයාට කෘත ගුණ සලකනු වස් හින්දූන් විසින් වාර්ෂික ව තෛපොංගල් උත්සවය පවත්වනු ලබයි.

වාසනාවන්ත සාමකාමී ජීවිත ගත කිරීමට හිරුගේ ආශීර්වාදය ලබා ගැනීම මේ උත්සවයේ තවත් අරමුණකි. ජූලි මාසයේ ලියදි සකසා, සී සා, පොළොව බුරුල් කර, හොඳින් පිළියෙල කර ගත් බිමෙහි පිරිසිදු බීජ වපුරා අස්වනු නෙළා ගෙට ගන්නා තුරු ගොවියා විඳින්නේ ඉමහත් වූ දුක් කන්දරාවකි. එහෙත් දෙසැම්බර්, ජනවාරි පමණ වන විට මහන්සියෙහි රන් අස්වනු දකින ගොවියාගේ සිත ප්‍රීතියෙන් ඉපිළ යයි. අස්වනු නෙළා ගෙට ගන්නා ගොවියා තම වගාව සාර්ථක කර ගැනීමට බෙහෙවින් උපකාර කළ හිරු දෙවියන් පුදන්නේ අස්වැන්නේ අග්‍රභාගයෙන් පොංගල් කිරිබත් පිළියෙල කිරීමෙනි.



හින්දූන් අතර හිරු, සඳු, අහස, පොළොව, වැනි ස්වාභාවික වස්තූන්ට පුද පූජා කිරීමේ චාරිත්‍රයක් අතීතයේ සිට පැවත එයි. තෛපොංගල් උත්සවයට ද දිගු ඉතිහාසයක් ඇත. මේ උත්සවයේ ආරම්භය පිළිබඳ තොරතුරු ඉපැරණි වේද ග්‍රන්ථවල සඳහන් වේ. ද්‍රවිඩ සාහිත්‍ය පොත්වලින් ද මේ පිළිබඳ සාධක හමු වේ. හින්දූන්ගේ ඉතිහාසය ආරම්භ වන්නේ "සංඝකාලම්" යුගයෙනි. එම යුගයේ ලියවුණු "පුරනානූරු" නම් පොතෙහි ද තෛපොංගල් උත්සවය ගැන සඳහන් ව ඇත. මේ අනුව තෛපොංගල් උත්සවයට වසර දෙදහසකටත් වැඩි දීර්ඝ ඉතිහාසයක් ඇත.

හින්දූහු කල්තියා ම තෛපොංගල් උත්සවය සඳහා ලක ලෑස්ති වෙති. නිවස හා අවට පරිසරය ද ශුද්ධ පවිත්‍ර කර නිවෙස්වලට අලුත් මුහුණුවරක් ලබා දීමට උත්සුක වෙති. නිවසට අලුත් බඩු මුට්ටු හා හැළි වළං මෙන් ම නිවැසියනට අලුත් ඇඳුම් පැළඳුම් ද මිල දී ගැනීමට ඔවුහු අමතක නො කරති. කැවිලිපෙවිලි පිළියෙල කිරීම දින කිහිපයක් මුළුල්ලේ සිදුවේ. කෙසෙල් ගසින් හා කොහොඹ, අඹ, උක්, වැනි අතුවලින් නිවෙසේ ප්‍රවේශ මඟ අලංකාර කෙරේ. අස්වනු නෙළා ගෙට ගන්නා තුරු විඳි දුක් ගැහැට ඉවත්කර යහපත සතුට ළංකර ගැනීම මින් සංකේතවත් වෙයි.

පොංගල් උත්සවය දින තුනක් තිස්සේ පැවැත්වේ. පොංගල් දිනයට පළමු දිනය "පොගී" උත්සව දිනය යනුවෙන් හැඳින්වේ. පෝගී යන්නෙන් අදහස් කෙරෙන්නේ නැති කිරීම යන්නයි. එදින හිරු උදා වන්නට මත්තෙන් නිවසේ තිබෙන සියලු ම කැලි කසළ සහ භාවිතයට ගත නොහැකි ලට්ටලොට්ට සියල්ල නිවස ඉදිරිපිට එළිමහනට ගෙන ගොස් ගිනි තබනු ලැබේ. මේ අනුව පෝගී සිරිත මඟින් ඔවුහු අනවශ්‍ය දේ ඉවත් කර තම සිත් ද පිරිසිදු කර ගනිති.

තෛපොංගල් උත්සවයේ වැදගත් ම දිනය උදවන්නේ මින් අනතුරුවයි. එදින අලුයම අවදි වී නා පිරිසිදු වන හින්දු භක්තිකයෝ තම නිවෙස් ඉදිරිපිට මිදුලේ "කෝලම්" අඳිති. කෝලම් ඇඳීම සඳහා බොහෝ විට යොදා ගන්නේ ධාන්‍ය අඹරා සකසා ගත් පිටි වර්ගයි. විවිධ රටා ඔස්සේ කෝලම් ඇඳීම සිදු කෙරේ. එම ධාන්‍ය පිටි කෘමීන්ට හා පක්ෂීන්ට අහරක් වෙති යි ඔවුහු විශ්වාස කරති. අලුත් ඇඳුම්පැලඳුම් ඇඳපැලඳ ගත් නිවැසියන් අතුරින් ගෘහ මූලිකයා නිවස ඉදිරිපිට සුබ මොහොතින් ළිප ගිනි මොළවයි, අලංකාර කොට සකසා ගත් නැවුම් මුට්ටියේ කිරි උතුරවයි. එම මුට්ටියට ම අලුත් සහල් එක් කොට ගෘහණිය කිරි බත පිසීම අරඹයි. ඉදෙන කිරි බතට ගිතෙල්, හකුරු, මුද්දරප්පලම්, ආදිය එක් කර රසමුසු පොංගල් කිරිබත සකසනු ලැබේ. අනතුරු ව එළිමහනේ එළන ලද පැදුරක පහනක් දල්වා පොංගල් කිරිබත, කහ, පොල්, කෙසෙල් ගෙඩි, උක්ගස්, විවිධ එළවළු වර්ග, හා මල් වර්ග තබා හිරු දෙවියන් පුදනු ලැබේ. මේ පූජාව පැවැත්වීමේ අරමුණ වන්නේ සත්‍යාඥනය, හොඳ චර්යාවන් යන ආදියෙන් සිත නමැති සැළිය අලංකාර කර එහි සතුට උතුරවා එම පිරිසිදු සිත සූර්ය දෙවියන්ට පුද කිරිමයි. මේ පූජාව අවසානයේ කැවිලි පෙවිලි හා පොංගල් කිරිබත අසල්වාසීන් සමග බෙදා හදා ගනිමින් ප්‍රීතිය භුක්ති විඳීමට ඔවුහු ප්‍රිය කරති. උදය කාලයේ සිදු කෙරෙන මේ කටයුතුවලින් අනතුරු ව ඔවුහු කෝවිල් පුජා සඳහා සම්බන්ධ වෙති.

එය හැඳින්වෙන්නේ "කාණුම් පොංගල්" දිනය ලෙස ය. තෛපොංගල් උත්සවය නිමාවන තුන්වන දිනය ද සුවිශේෂිත වූවකි. "මාඩු පොංගල්" යනුවෙන් ගැමියන් හඳුන්වන මේ උත්සවය ගොවිතැනට බෙහෙවින් උපකාරී වන ගවයා උදෙසා තුති පුදන දිනයයි. හින්දු භක්තිකයෝ ගවයා දේවත්වයෙන් පුදති.

ගොම පොහොරින් මෙන් ම වගාව සශ්‍රීක කර ගැනීමට තම ශ්‍රමයෙන් දායක වන ගවයාට කෘත ගුණ දැක්වීම එදින සිදු කෙරේ. පස්ගෝරසයෙන් මිනිසාගේ පෝෂණයට උපකාරී වන ගවයාට ප්‍රත්‍යුපකාර දක්වන හින්දු භක්තිකයෝ මෙදින ගවගාල ශුද්ධ පවිත්‍ර කර ගොම මැටි ගා සකස් කරති. ගවයා වටිනා රෙද්දකින් සරසා මල් ගවසා පොට්ටු තබා සරසයි. අනතුරු ව ඌට පොංගල් කෑමට දෙනු ලැබේ. මෙලෙස ගොවිතැන හා අත්‍යන්තයෙන් ම බැඳුණු ගවයා සඳහා කරන සත්කාරයෙන් පොංගල් උත්සවය අවසන් කෙරේ. ඉන්දියාවේ මාඩු උත්සවය ඉතා උත්කර්ෂවත් ලෙස සිදු කරනු ලබයි. ශක්තිමත් ගවයකුගේ ගෙලෙහි මුදල් පසුම්බියක් එල්ලා ඌ කුලප්පු කොට මුදහරිනු ලැබේ. ඌ අල්ලා මෙල්ල කර මුදල් පසුම්බිය ලබා ගන්නා තැනැත්තා වීරයකු ලෙස පිළිගනු ලැබේ. ඉන්දියාවේ "අලංග නල්ලූර්" නම් ප්‍රදේශය මේ ක්‍රීඩාවට ප්‍රසිද්ධ ය.



ලංකාවේ හින්දූන් අතර මෙබඳු ක්‍රීඩාවක් දක්නට නොමැති වුවත් ඔවුහු ඉතා භක්ත්‍යාදරයෙන් මාඩු පොංගල් උත්සවය පවත්වති. හිරුට, වැස්සට, අහසට, පොළොවට, ජලයට හා ගවයාට ආශීර්වාද කරමින් දින තුනක් තිස්සේ පැවැත්වෙන තෛපොංගල් උත්සවය මෙසේ නිම කෙරේ.

**අරුත් පැහැදිලි කිරීම්**

01. **අග්‍රභාගය** . **මුල් කොටස/ ප්‍රථමභාගය**
02. **පොංගල්** . **සහල්, ගිතෙල්, හකුරු මුද්දරප්පලම් ආදිය දමා සකස් කරන ලබන කිරි බතකි.**
03. **පෝගී** . **නැති කිරීම**

## ක්‍රියාකාරකම 01

i. තෛපොංගල් උත්සවය පැවැත්වීමේ අරමුණු මොනවා ද?
ii. මේ උත්සවයේ ප්‍රධාන අවස්ථා තුන නම් කරන්න.
iii. හින්දූන් තෛපොංගල් උත්සවය සඳහා සූදානම් වන ආකාරය පැහැදිලි කරන්න.
iv. හින්දූන් පක්ෂීන් හා කෘමීන් ගැන පවා අනුකම්පාව දක්වන බැව් සනාථ වන අවස්ථාවක් නම් කරන්න.
v. තෛපොංගල් උත්සවයේ චාරිත්‍ර විධි කෙටියෙන් සඳහන් කරන්න.
vi. හින්දු භක්තිකයන් විසින් පවත්වනු ලබන තෛපොංගල් උත්සවය සිංහලයින්ගේ කුමන උත්සවයකට සමාන වන්නේ ද?
vii. මේ උත්සවය පැවැත්වීම මගින් හින්දූන්ගේ කවර ගුණයක් ඉස්මතු වේ ද?

## ක්‍රියාකාරකම 02

- **පාඩමෙහි යෙදී ඇති පහත සඳහන් පද කියවන්න.**

| | | |
|---|---|---|
| ගේදොර | බඩුමුට්ටු | ලට්ටලොට්ට |
| කැවිලිපෙවිලි | ඇඳුම්පැළඳුම් | |
| හැළිවළං | චාරිත්‍රවාරිත්‍ර | |

සිංහල භාෂාවේ යෙදෙන මෙබඳු පද යුගල පද යනුවෙන් හැඳින්වේ. යුගල පද මගින් ප්‍රකට වන අර්ථ සලකා පහත දක්වා ඇති අයුරින් වර්ගකර දැක්විය හැකි ය.

01. පද දෙකෙහි ම අර්ථය සමාන වන යුගල පද
 නිදසුන් :
 ගරු - නම්බු
 කෙළි - සෙල්ලම්
 ගේ - දොර

02. පද දෙකෙහි අර්ථ එකිනෙකට ප්‍රතිවිරුද්ධ වන යුගල පද

නිදසුන් :

සිරිත් - විරිත්
පින් - පව්
අය - වැය

03. පද දෙකෙන් පළමු වන පදයේ අර්ථයක් ඇතත්, දෙවන පදයේ විශේෂ අර්ථයක් නොමැති යුගල පද

නිදසුන් :

කුඩ - බුඩ
බඩු - මුට්ටු
ගමන් - බිමන්

04. පද දෙකේ ම අර්ථ භාවයක් නොමැති ව යෙදෙන යුගල පද

නිදසුන් :

අනම් - මනම්
ලට්ට - ලොට්ට

- ඉහත සඳහන් එක් එක් වර්ගයට අයත් යුගල පද පහ බැගින් එකතු කර ඒවා යොදා අර්ථවත් වැකි නිර්මාණය කරන්න.

## ක්‍රියාකාරකම 03

- උපකාරක පද ඉවහල් කරගෙන පහත දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 න | | | | 6 ක | ■ | 7 පො |
| | ■ | ■ | ■ | | ■ | |
| | ■ | 2 | | ර | | |
| | ■ | ■ | ■ | | ■ | ■ |
| ■ | 8 | ■ | 3 | ම | | න් |
| ■ | | ■ | | ■ | ■ | ■ |
| ■ | | ■ | | ■ | ■ | ■ |
| 4 | | ■ | 5 න | | | |

**හරහට**

01. ඉස්ලාම් ආගමේ ශාස්තෘවරයෙකි.
02. බෞද්ධ ආගමේ ශාස්තෘවරයායි.
03. ඉස්ලාම්වරුන්ගේ උත්සවයකි.
04. මිනිසුන් අසාධාරණය වෙනුවෙන් කන්නලව් කරන දේවතාවියකි.
05. හින්දු ආගමිකයින් විසින් දින නවයක් පවත්වනු ලබන පූජාවකි.

**පහළට**

01. ක්‍රිස්තු භක්තිකයින්ට ඉතා වැදගත් දිනයකි.
03. හින්දු දේව පුරාණයකි.
06. මොනරා වාහනය කරගත් දෙවියන් වැඩසිටින ස්ථානයකි.
07. ලක් වැසි බෞද්ධයන්ට වැදගත් පොහොයකි.
08. හින්දූන් පහන් ආලෝකයෙන් දීප්තිමත් කරන දිනයකි.

## ක්‍රියාකාරකම 04

1. පහත දැක්වෙන පද සුදුසු පරිදි සන්ධිකර එහි අර්ථ පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.
   - i. අත + අන්තයෙන්
   - ii. අත + උත්කර්ෂවත්
   - iii. භක්ති + ආදරය
   - iv. ප්‍රති + උපකාර
   - v. මහ + උපකාරී

2. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.
   1. වෛද්‍යවරයා රෝගීන් පරීක්ෂා කළේ ය.
   2. ආරක්ෂක ඇමති ආරක්ෂක ප්‍රධානීන් කැඳවයි.
   3. ගුරුවරු දරුවන් ඉගෙනුමට යොමු කරති.
   4. හින්දු භක්තිකයා ගවයින් දේවත්වයෙන් සලකයි.
   5. පැරැන්නෝ අස්වනු නෙළා ගෙට ගෙන දෙවියන් පුදති.

### පැවරුම්

1. **සිංහල හින්දු අලුත් අවුරුද්ද, අලුත් සහල් මංගල්‍යය ආදියෙහි පවතින චාරිත්‍ර විධි, තෛපොංගල් උත්සව චාරිත්‍ර විධි සමඟ සසඳමින් ඇගයීමක් කරන්න.**
2. **අස්වනු නෙළා ගත් අපේ පැරණි මුතුන් මිත්තන් අනුගමනය කළ චාරිත්‍ර වාරිත්‍ර මොනවා ද යි වැඩිහිටියන්ගෙන් අසා දැන ගෙන පන්තියට ඉදිරිපත් කරන්න.**
3. **තෛපොංගල් උත්සවය පිළිබඳ ව තවත් තොරතුරු දැන ගැනීම සඳහා හින්දු භක්තිකයන් සමඟ සාකච්ඡා කරන්න.**
4. **දීපාවලි, මහා ශිවරාත්‍රිය, රාමසාන්, හජ්ජ් යන උත්සව පිළිබඳ තොරතුරු රැස්කර පාසල් බිත්ති පුවත්පතෙහි පළ කරන්න.**